**ශීර්ෂය 319 - සබරගමුව පළාත් සභාව**

**1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය**

**1.1 දැක්ම**

සබරගමුව අනභිබවනීයත්වයට.

**1.2 මෙහෙවර**

සබරගමුව ජනතාවගේ අභිවෘද්ධිය සඳහා සියලුම සම්පත් ඵලදායීව හා ගුණාත්මකව කළමනාකරණය කිරීම තුළින් සබරගමුව අභිමානවත් පෙරගමනකට.

**1.3 කාර්යභාරය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

**2. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

සබරගමුව පළාත් සභාව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 28,123.5 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2020 දෙසැම්බර් 31 දිනට** | |
|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** |
| | රු.මිලියන | රු.මිලියන |
| පුනරාවර්තන | 26,688 | 26,688 |
| මූලධන | 1,435.5 | 1,435.5 |
| එකතුව | 28,123.5 | 28,123.5 |

3. විගණන නිරීක්ෂණය

ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා දුන් ප්‍රතිපාදන පළාත් සභාව විසින් පළාත් සභාවේ අරමුදල යටතේ ගිණුම්ගත කර උපයෝජනයන් සිදුකර තිබුණි. පළාත් සභා අරමුදල විගණනය කර ඒ පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.